**කයිට්ස් ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2016 මාර්තු 24 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 23 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2015 සැප්තැම්බර් 28 දින සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණණය කළ මතය

මෙම වාර්තාවේ **1.3** ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් කයිට්ස් ප්‍රාදේශීය සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිමු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ දෝෂ

(අ) රු.3,589,223 ක් වූ විශ්‍රාම වැටුප් අධයක්ෂ ජනරාල් වෙත ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් ගිණුම්ගත නොකිරීම නිසා පෙර වර්ෂයේ සමුච්චිත අරමුදල වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) රු.3,686,170 ක් වූ විශ්‍රාම වැටුප් අධයක්ෂ ජනරාල් වෙත ගෙවිය යුතු මුදල සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. එම හේතුවෙන් ආදායම වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සභාවට අයත් නොවූ, රු.19,892,500 ක් වූ වාහන තුනක වටිනාකමක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර තිබුණි. එම හේතුවෙන් රථ වාහන වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.

#### 1.3.2 ගෙවිය යුතු මුදල්

රු.830,475 ක් වූ, මියගිය නිලධාරියකුගේ නොගෙවූ වැටුප් උරුමකරුවන්ට නොගෙවා වර්ෂ 2013 සිට 2015 දක්වා තැනපත් කර තිබුණි.

### 1.3.3 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති** පරිච්ඡේදය II - රීති අංක 4 | දේපල තක්සේරු කිරීමේ ප්‍රමාද හේතුකොට ගෙන සභාව විසින් පසුගිය වසර ගණනාවක් තිස්සේ තක්සේරු බදු අයකරගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, ඉකුත් වර්ෂය සඳහා වූ රු.4,129,285 ක් වූ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම සමඟ සැසඳූවිට, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,855,576 ක් විය. වියදම වැඩිවීම හේතුවෙන්, වියදම ඉක්මවූ ආදායම රු.273,529 කින් අඩුවී තිබුණි.

### 2.2 කාරක ප්‍රාග්ධනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, රු.31,589,172 ක් වූ පසුගිය වර්ෂයේ කාරක ප්‍රාග්ධනය සමඟ සැසඳූවිට, සභාවේ සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු.30,909,742 ක් විය. එම හේතුවෙන් කාරක ප්‍රාග්ධනය රු.679,430 කින් අඩු වී තිබුණි.

### 2.3 ආදායම් කළමනාකරණය

#### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

ලේකම් විසින් ඉදිරිපත් කරන ලද පරිදි, සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015 | | 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | | | රු'000 |
| | ඇස්තමේන්තුගත | තත්‍ය | |
| | රු'000 | රු'000 | |
| බදු කුලී | 2,259 | 1,899 | 6 |
| බලපත්‍ර ගාස්තු | 290 | 365 | - |
| වෙනත් ආදායම් | 36,511 | 30,587 | 5,776 |
| එකතුව | 39,060 | 32,851 | 5,782 |

**2.3.2 කුලී මුදල්**

සභාවට අයත් සාප්පු හතරක් කුලියට දී නොතිබුණි.

**2.3.3 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු**

(අ) රු.57,150 ක් වූ ලැබිය යුතු උසාවි දඩ මුදල් සමාලෝචිත වර්ෂය තුලදී අයකරගෙන නොතිබුණි.

(ආ) 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු.4,335,431 ක් වූ ලැබිය යුතු මුද්දර ගාස්තු ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතින් අයකරගෙන නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

සභා ප්‍රදේශය තුල ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත්ව ක්‍රියාත්මක කර නොතිබුණි.

**4. වගකීම්භාරය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

අවිධිමත් අයවැය පිළියෙල කිරීම හේතුකොටගෙන රු.284 සිට රු.4,023,712 දක්වා අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර වෙනස්කම් නිරීක්ෂණය විය.

**4.2 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්**

සමාලෝචිත වර්ෂය තුලදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

**4.3 වත්කම් කළමනාකරණය**

**-------------------------**

**4.3.1 අක්‍රීය වත්කම්**

**--------------**

(අ) සභාව විසින් රු.885,000 ක පිරිවැයක් දරා ඉදිකරන ලද සතිපොල අක්‍රීයව පැවතුණි.

(ආ) සභාවට අයත් බෝට්ටුවක් අවුරුදු 02 කට අධික කාලයක් තිස්සේ අක්‍රීයව පැවතුණි.

**5. පද්ධති හා පාලන**

**------------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) වාහන ලොග් පොත්

(ආ) තක්සේරු බදු අයකර ගැනීම